# MONEY, BANKS
# &
# PRICE LEVELS
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මුදල් සැපයුම

මුදල් සැපයුම යනු කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනතාව අතර සංසරණය වන මුළු මුදල් තොගය යි.

මුදල් සැපයුම මූල්‍ය සමස්තය වශයෙන් ද හඳුන්වයි.

මුදල් සැපයුම නිර්වචනය කිරීම සඳහා යොදා ගන්නා නිර්වචන කාලයත් සමඟ වෙනස් වේ.

ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකකි.

- රටක මූල්‍ය ව්‍යුහයේ ඇති වන වෙනස්කම්
- මුදල් ලෙස සැළකිය යුතු පූර්ණ ද්‍රවශීලතාවෙන් යුත් වත්කම්වල සිදු වන වෙනස්කම්

ClassWork.LK

# මුදල් සැපයුම පිළිබඳ ව ඉදිරිපත්කොට ඇති විවිධ නිර්වචන

ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පිළිබඳ ව ඉදිරිපත්කොට ඇති විවිධ නිර්වචන පහත දැක්වේ.

පටු මුදල් සැපයුම ( $M_1$ )

පුළුල් මුදල් සැපයුම ( $M_2$ )

ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ( $M_2b$ )

පුළුල් මුදල් සැපයුම ( $M_4$ )

ClassWork.LK

# <u>පටු මුදල් සැපයුම</u> ( $M_1$ )

පටු මුදල් සැපයුම යනු මහජනතාව සතු ව්‍යවහාර මුදල් (කාසි හා නෝට්ටු) හා මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති ඉල්ලුම තැන්පතුවල එකතුව යි.

$$M_1 = C_P + DD_P$$

$M_1$ = පටු මුදල් සැපයුම

$Cp$ = මහජනයා සතු ව්‍යවහාර මුදල්

$DD_p$ = මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු

ClassWork.LK

## පුළුල් මුදල් සැපයුම ( $M_2$ )

පුළුල් මුදල් සැපයුම ($M_2$) යනු, පටු මුදල් සැපයුම ($M_1$) හා මහජනයා සතු ව වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතුවල $TSD_{CP}$ එකතුවයි.

$$M_2 = M_1 + TSD_{cp}$$

$M_2$ = පුළුල් මුදල් සැපයුම

$M_1$ = පටු මුදල් සැපයුම

$TSD_{cp}$ = මහජනතාව සතු ව වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

ClassWork.LK

# ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ( $M_2b$ )

පුළුල් මුදල් සැපයුමට ($M_2$) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50% ක් හා විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය එකතු වීමෙන් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සෑදේ.

$$M_{2b} = M_2 + TSD_{NRFC} + RD_{FCBU}$$

$TSD_{NRF}$ = අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50%

$RD_{FCBU}$ = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු

ClassWork.LK

# <u>පුළුල් මුදල් සැපයුම</u> ( $M_4$ )

ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට ($M_{2b}$) බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු එකතු වීමෙන් පුළුල් මුදල් සැපයුම ($M_4$) සෑදේ.

$$M_4 = M_{2b} + LSB + REC$$

$M_4$ = පුළුල් මුදල් සැපයුම

$M_{2b}$ = ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම

$LSB$ = මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

$RFC$ = ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

ClassWork.LK

# මුදල් සැපයුම තීරණය කරන සාධක

- බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්
- අනෙකුත් ශුද්ධ වත්කම්

ClassWork.LK

# බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්

බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්, බැංකු ක්‍රමය මගින් රජයට ලබා දෙන ශුද්ධ ණය හා වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණයවලින් සමන්විත වේ.

රජය අයවැය හිඟය පියවීම සඳහා මහ බැංකුවෙන් හා වාණිජ බැංකුවලින් පිළිණපත් හරහා ණය ලබා ගනී. ඒවා ව්‍යවහාර මුදල් ලෙස මහජනතාව අතට පත්වීමෙන් මුදල් සැපයුමේ කොටසක් බවට පත් වී මුදල් සැපයුම ඉහළ නගී.

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ණය දීමේ දී ඉල්ලුම් තැන්පතු නිර්මාණය වේ. ඉල්ලුම් තැන්පතු මුදල් සැපයුමේ කොටසක් නිසා මුදල් සැපයුම ඉහළ යයි.

ClassWork.LK

# බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්

බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් නමින් හැඳින්වෙන්නේ මහ බැංකුව සහ වාණිජ බැංකු සතු විදේශ වත්කම් හා විදේශ වගකීම් අතර වෙනසයි.

මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් සහ වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් වල එකතුවෙන් බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් ලැබේ.

ClassWork.LK

## මහ බැංකුව සතු විදේශ වත්කම්

මහ බැංකුව සතු විදේශ වත්කම් පහත පරිදි දැක්විය හැකි ය.

- මහ බැංකුව සතු විදේශ මුදල්
- විදේශ රටවල සුරැකුම්පත්වල මහ බැංකුව කර ඇති ආයෝජන
- මහ බැංකුව නමින් පවත්වා ගෙන යන විශේෂ ගැනුම් හිමිකම් (SDR)

## මහ බැංකුව සතු විදේශ වගකීම්

මහ බැංකුව සතු විදේශ වගකීම් පහත පරිදි වේ.

- මහ බැංකුව විදේශ රටවලින් ලබා ගෙන ඇති ණය
- අන්තර්ජාතික ආයතන හා විදේශ බැංකු මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල්

ClassWork.LK

## වාණිජ බැංකු සතු විදේශ වත්කම්

- විදේශ බැංකුවලට සපයා ඇති ණය සහ ආධාර
- වට්ටම් කළ බිල්පත්
- වාණිජ බැංකු සතු විදේශ මුදල්
- වාණිජ බැංකුවලට අයත් විදේශ ශාඛාවල ඇති මුදල්

## වාණිජ බැංකු සතු විදේශ වගකීම්

- වාණිජ බැංකු විසින් විදේශ බැංකුවලින් ලබා ගෙන ඇති ණය
- විදේශීය බැංකු දේශීය බැංකුවල පවත්වා ගෙන යන තැන්පතු

බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් ඉහළ යන විට බැංකු සතු සංචිත ඉහළ ගොස් ණය දීම් වැඩි වේ. එවිට ඉල්ලුම් තැන්පතු ප්‍රසාරණය වී මුදල් සැපයුම වැඩි වේ.

ClassWork.LK

# බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම්

බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම් ලෙස සැලකෙනුයේ ඉහත සඳහන් කරන ලද දේශීය හා විදේශීය ශුද්ධ විදේශීය වත්කම්වලට හසු නොවූ බැංකු ක්‍රමයේ වත්කම් හා වගකීම් අතර වෙනසයි.

බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම් ඉහළ යන විට මුදල් සැපයුම ද ඉහළ යයි.

ClassWork.LK

# පදනම් මුදල්

කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුව සතු ඍජු මූල්‍ය වගකීම් පදනම් මුදල් වශයෙන් හැඳින්වේ.

මේවා අධිබලැති මුදල්, සංචිත මුදල් යන නම්වලින් ද හැඳින්වේ.

රටේ සමස්ත මුදල් සැපයුම පදනම් මුදල් මෙන් කීප ගුණයකි.

## පදනම් මුදල්වල සංරචක

- මහජනයා සතු ව්‍යවහාර මුදල් (Cp)
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ($C_{CB}$)
- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු (RR)
- රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වා ගන යනු ලබන තැන්පතු ($D_{OI}$)

ClassWork.LK

# මහ බැංකු ශේෂ පත්‍රය

| වගකීම් | වත්කම් |
|---|---|
| • මහජනයා සතු ව්‍යවහාර මුදල් $C_P$<br>• වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් $C_{CB}$<br>• වාණිජ බැංකු සතු මහ බැංකුවේ ඇති තැන්පතු RR<br>• වෙනත් ආයතනවල තැන්පතු $D_{OI}$<br>• රජයේ තැන්පතු $DG_{CB}$<br>• විදේශ ණය $FB_{CB}$<br>• වෙනත් වගකීම් $OL_{CB}$ | • වාණිජ බැංකුවලට දුන් ණය $A_{KB}$<br>• රජයට දුන් ණය $CG_{CB}$<br>• විදේශ සංචිත $FA_{CB}$<br>• වෙනත් වත්කම් $OA_{CB}$ |
| මුළු වගකීම් $TL_{CB}$ | මුළු වත්කම් $TA_{CB}$ |

ClassWork.LK

# මහ බැංකුවේ ප්‍රධාන වගකීම් අයිතම

ඉහත ශේෂ පත්‍රයට අනුව පදනම් මුදල් සැපයුමට අයත් වන මහ බැංකුවේ ප්‍රධාන වගකීම් අයිතම පහත පරිදි දැක්විය හැකි ය.

- මහජනයා සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
- මහ බැංකුවේ ඇති වාණිජ බැංකු සතු තැන්පතු
- වෙනත් ආයතන සතු ව මහ බැංකුවේ ඇති තැන්පතු

ClassWork.LK

# මහ බැංකුවේ ප්‍රධාන වත්කම් අයිතම

ඉහත ශේෂ පත්‍රයට අනුව පදනම් මුදල් සැපයුමට අයත් වන මහ බැංකුවේ ප්‍රධාන වත්කම් අයිතම පහත පරිදි දැක්විය හැකි ය.

- මහ බැංකුව සතු ශුද්ධ දේශීය වත්කම් (CGCB - DGCB)
- මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම්
- මහ බැංකුව විසින් රජයට සපයනු ලබන ශුද්ධ ණය
- මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් (DACB - FBCB)
- මහ බැංකුවේ වෙනත් වත්කම්

ශුද්ධ වත්කම් වැඩි වන විට පදනම් මුදල් සැපයුම වැඩි වන අතර ශුද්ධ වත්කම් අඩු වන විට පදනම් මුදල් සැපයුම අඩු වේ.

ClassWork.LK

# ආර්ථිකයේ මුළු මුදල් සැපයුම හා පදනම් මුදල් අතර සම්බන්ධය

ආර්ථිකයේ මුළු මුදල් සැපයුම හා පදනම් මුදල් අතර සම්බන්ධය මුදල් ගුණකයෙන් දැක්වේ.

එය පහත සඳහන් පරිදි සමීකරණයක් මගින් දැක්විය හැකි ය.

$$M = kH$$

M = මුදල් සැපයුම

K = මුදල් ගුණකය

H = පදනම් මුදල්

ClassWork.LK

# මුදල් ගුණකය හා මුදල් පදනම අතර පවත්නා සම්බන්ධතාව

මුදල් ගුණකය පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$$k = \frac{M}{H}$$

ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම ක්‍රම කිහිපයකට ගණනය කරන නිසා මුදල් ගුණකය ද $M_1$, $M_{2B}$ $M_{2B}$, $M_4$, $M_5$ ආදී වශයෙන් ආකාර කිහිපයකට ගණනය කළ හැකි ය.

නිදසුන් :

$$\text{මුදල් ගුණකය } M_1 = \frac{\text{පටු මුදල් සැපයුම } (M_1)}{\text{පදනම් මුදල්}}$$

$$\text{මුදල් ගුණකය } M_2 = \frac{\text{පුළුල් මුදල් සැපයුම } (M_2)}{\text{පදනම් මුදල්}}$$

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura